**මධ්‍යම පළාත් සභාව - 2019**

**-----------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

මධ්‍යම පළාත් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2020 ඔක්තෝබර් 20 දින නිකුත් කරන ලද අතර, ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව සැප්තැම්බර් 24 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගනණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්ව ඇත.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් සිදුකරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත පිළියෙල කර ඇති බව ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සඳහන් කර තිබුණ ද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් ලෙස අන්තර් පළාත් ණය ශේෂ නිරවුල් කිරීමේ ගිණුමේ ශේෂය රු.11,573,474 ක් ද, ගෙවිය යුතු තැන්පතු හා අනෙකුත් වගකීම්, විවිධ වගකීම් හා අන්තර් පළාත් ණය ශේෂ නිරවුල් කිරීමේ ගිණුමෙහි එකතුව රු.598,903,701 ක් වගකීම් ලෙස දක්වා තිබුණි. | අනාවරණය කළ ගිණුම් ප්‍රතිපත්ති මත ගිණුම් පිළියෙල කළ යුතු වේ. | මධ්‍යම පළාත් සභාවේ ආයතනවලින් මධ්‍යම රජයේ ආයතන හා පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් පළාත් සභාවට අයවිය යුතු අත්තිකාරම් ලෙස ලබාදුන් ණය ජංගම වත්කම් ලෙස සඳහන් කර ඇති බවත්, වැන්දඹු අනත්දරු, පොදු තැන්පත්, මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අග්‍රිම ශේෂ හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ මුදල් වර්ෂය අවසානයේ පළාත් භාණ්ඩාගාරයට පැවරීම මත අදාළ තහවුරු කිරීම් සිදුකර ගැනීමට නොහැකි වූ බැවින් වගකීමක් ලෙස එකී ශේෂ හඳුනාගෙන ඇත. |
| (ආ) | මූලධන වත්කම් වැඩිදියුණු කිරීම හා අත්පත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී ආයතන 08 ක් විසින් වැයකරන ලද එකතුව රු.1,228,090,608 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් ලෙස දක්වා නොතිබුණු අතර එම වටිනාකමින් ජංගම නොවන වත්කම් සංචිත අරමුදල ද අඩුවෙන් දක්වා තිබුණි. | මූලධන වියදම් ප්‍රාග්ධනිත කිරීම හා ඒවා මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කිරීම. | අඩුපාඩුව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු.37,513,684 ක පොදු තැන්පත් ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ දක්වා නොතිබුණි. | පොදු තැන්පත් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ දැක්වීම. | අදහස් දක්වා නොමැත. |

## 1.6.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත අත්තිකාරම් සඳහා වූ ණය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා තිබූ රු.171,994,728 ක ශේෂය වර්ෂ කිහිපයක සිට නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | නිරවුල් නොවූ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම. | මධ්‍යම පළාත් රෝහල්වල රෝගී සත්කාර සේවාවන් බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ගෙවීම් අනුමත අත්තිකාරම් ගිණුම මහින් ඉටුකර ගෙන ඇති බවත්, රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් මෙම ගෙවීම් සඳහා මුදල් ලද පසු රු.171,988,242 ක ශේෂය ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. සමූපකාර සේවක කොමිෂන් සභාවේ රු.6,486 ක ශේෂය පළාත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිරාකරණය කර ගැනීමට කටයුතු කරන ලෙස 2001 වර්ෂයේ ගිණුම් කාරක සභාවේදී තීරණය ලබාදී ඇත. |
| (ආ) | වගකීම් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා තිබූ රු.6,956,869 ක අන්තර් පළාත් ස්ථානමාරු ණය ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම හා අවිනිශ්චිත ගිණුම් ශේෂ හඳුනාගෙන නිරවුල් | පළාත් භාණ්ඩාගාරය පළාතේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලට ස්ථාන මාරු වී පැමිණි හා ගිය නිලධාරීන්ගේ ණය ශේෂ පවරා ගෙන නිරවුල් කරන තෙක් ගෙවිය යුතු ශේෂ |

| | | | |
|---|---|---|---|
| | අතර ඒ තුළ අන්තර්පළාත් අවිනිශ්චිත ගිණුම ලෙස දක්වා තිබුණු පසුගිය වසරේ රු.1,088,623 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.2,131,194 ක් දක්වා වර්ධනය වී තිබුණි. | කිරීමට කටයුතු කිරීම. | පෙන්නුම් කරන බවත් අන්තර් පළාත් අවිනිශ්චිත ගිණුම තුළද, හඳුනා නොගත් ණය ශේෂ හඳුනාගෙන ගිණුම් ගත කරන තෙක් ණය ශේෂ පෙන්නුම් කරන බවත් අදාළ ණය ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ඇ) | විවිධ වගකීම් ගිණුමෙහි වර්ෂ කිහිපයක සිට නොවෙනස්ව ඉදිරියට එන, හැටන් සීඩා අත්තිකාරම් ගිණුමේ රු.716,768 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කිරීම. | මෙම ගිණුම් ශේෂය අදාළ වන්නේ මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුමට වුවත්, යතුරුලියන දෝෂයකින් හැටන් සීඩා අත්තිකාරම් ගිණුම ලෙස සඳහන් කර ඇත. මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම පියවා වසා දැමීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

### 1.6.3 නොපිය වූ අග්‍රිම ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2003, 2006 හා 2019 වර්ෂවලට අදාළව එකතු වටිනාකම රු.37,930,645 ක නොපිය වූ අග්‍රිම ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ 2019 වර්ෂයට අදාළව ආයතන 17 ක නොපියවූ අග්‍රිම ශේෂ එකතුව රු.37,713,088 ක් විය. | තවදුරටත් නිරවුල් කළ යුතු අග්‍රිම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම. | 2003 වර්ෂයට අදාළව රු.136,243 ක ශේෂයෙන් රු.14,150 ක ශේෂයක් අයවී ඇති බවත් 2006 වර්ෂයට අදාළ රු.81,314 ක ශේෂය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය හා ගිණුම් පොත් අතර වෙනසක් ඇති බවත් එය විසඳීමට කටයුතු කරන බවත් ආයතන 14 කින් රු.34,101,770 ක අග්‍රිම ශේෂයක් නිරවුල් කර ඇති බවත් දන්වමි. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | | |
| (i) රජයේ ඉඩම් ආඥා පනතේ 180 වැනි නියෝගය ප්‍රකාරව අනවසරයෙන් රජයේ ඉඩම් අල්ලා ගැනීම වැළැක්වීම සඳහා ක්ෂේත්‍ර නිලධාරී මඟින් අදාළ වාර්තා දෙසතියකට වරක් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ග්‍රාම නිලධාරි වසම් 20 ක වාර්තා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කිරීම. | පරිපාලන ග්‍රාම නිලධාරි මඟින් අදාළ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් කළ අතර, 2020 වර්ෂයේදී දෙසති වාර්තා විධිමත් පරිදි ලබාගනිමි. |
| (ii) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත අනුව මධ්‍යම පළාත තුළ ලියාපදිංචි නොකළ ව්‍යාපාර 9071 ක් පවතින බව හඳුනාගෙන තිබුණ ද, එම ව්‍යාපාර ආඥා පනත ප්‍රකාරව ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලු ව්‍යාපාර ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම. | ලියාපදිංචි නොකළ ව්‍යාපාර ලියාපදිංචි කරන ලෙසට ව්‍යාපාරිකයින් දැනුවත් කර ඇත. |
| (iii) 1942 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාර පළාත් සභාවේ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 11 දෙනෙක් සඳහා 2018 ඔක්තෝබර් සිට 2020 ජූලි දක්වා ගෙවා තිබූ දීමනා වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු රු.1,508,130 ක සේව්‍ය සේවක දායක මුදල් එම අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. | ආඥා පනත අනුව ක්‍රියා කිරීම. | අඩුපාඩුව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම පළාත් මූල්‍ය රීති - 60<br>---------------------------------- | | |
| | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 18 ක දී සිදුව තිබූ හානි හා 2018 වර්ෂය තුළ දී අවස්ථා 41 ක දී සිදුව තිබූ හානි ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන හානි ලේඛනයේ සටහන්කර නොතිබූ අතර එම හානි වෙනුවෙන් පිළිවෙළින් රු.1,252,893 ක් හා 5,229,945 ක් රක්ෂණ වන්දි වශයෙන් ලැබී තිබුණි. | අදාළ නීති, රීති ප්‍රකාරව කටයුතු කිරීම. | අඩුපාඩුව පිළිගනිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි<br>--------------------------------------------------------- | | |
| | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වසර 02 ක ඉක්මවූ රු.1,477,010 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල්ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට ගැනීමට කටයුතු කිරීම. | ඉදිරියේ දී නිවැරදි කරමි. |
| (ඈ) | ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ<br>------------------------------------------------- | | |
| | ජනාධිපති ලේකම්ගේ පීඑස්/සීඑස්ඒ/11-18 හා 2018 ඔක්තෝබර් 12 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයෙන් ප්‍රතිපාදන සලසා නොතිබියදී 2018 ඔක්තෝබර් 15 සිට 2019 ඔක්තෝබර් 31 දක්වා මසකට රු.40,000 බැගින් එකතුව රු.420,000 ක නිවාස කුලී දීමනාවක් පළාත් සභාවේ සභාපතිවරයාට ගෙවා තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | අංක CPC/CM/CB/2013/35 හා 2013.11.27 දිනැති මධ්‍යම පළාත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සභාපතිවරයා සඳහා නිල නිවාස ලබා ගැනීමට රු.40,000 ක මාසික දීමනාවක් ලබා දීමට අනුමැතිය ලබාදී ඇති බවත්, ඒ අනුව සභාපතිවරයා සඳහා රු.40,000 ක මාසික දීමනාවක් ගෙවනු ලබයි. |

(ඉ) වෙනත් චක්‍රලේඛ
---------------------

| | | |
|---|---|---|
| 2016 මාර්තු 09 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් ප්‍රතිපාදන සලසා නොතිබියදී පළාත් සභාවේ සභාපතිවරයාට මසකට රු.95,000 බැගින් 2018 මාර්තු සිට 2020 ජූලි දක්වා රු.2,593,382 ක් ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කිරීම. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සභාපතිධුරය දරන අයෙකු රාජ්‍ය නිලධාරියෙකු නොවන අතර, ජනාධිපති චක්‍රලේඛ PS/ASA/11-18 හා 2018.10.12 දිනැති චක්‍රලේඛය අනුව, ඔහුට නිල වාහන භාවිතය හා ඉන්ධන දීමනා ලබා ගැනීමට විධිවිධාන සලසා ඇත. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අනුව පළාත් සභාවේ මූල්‍ය බලය මූලිකව හිමිව ඇත්තේ ගරු ආණ්ඩුකාර තුමා වෙතය. |

## 02. ආදායම් කළමනාකරණය
---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තථ්‍ය ආදායම ඇස්තමේන්තු ආදායමට වඩා වැඩි අගයක් ගෙන තිබූ ආදායම් විෂයයන් 08 ක විචලනය සියයට 16 සිට සියයට 5796 දක්වා පරාසයක පැවතුණු අතර, තථ්‍ය ආදායම ඇස්තමේන්තු ආදායමට වඩා අඩු අගයක් ගෙන | තාත්ත්වික ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කිරීම. | අඩුපාඩුව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | තිබූ ආදායම් විෂයයන් 08 ක් අතර විචලනය සියයට 15 සිට සියයට 100 දක්වා පරාසයක ගෙන තිබුණි එසේම සමාලෝචිත වර්ෂයේ දී බදු නොවන ආදායම් යටතේ ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් රු.30,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණ ද, එමගින් කිසිදු ආදායමක් ලබා ගැනීමට පළාත් සභාව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2017, 2018, 2019 වර්ෂවල දේපල පැවරීම් මත අයවිය යුතු මුද්දර බදු ආදායම් පිළිවෙළින් රු.1,318,052 ක් රු.4,060,100 ක් හා රු.653,150 ක් කපාහැර තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | හිඟ ආදායම් නිදහස් කිරීම 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ 79 සහ 87 වගන්ති අනුව සිදුකර ඇත. |
| (ඇ) | මධ්‍යම පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 ක හිඟ හිටි ඉඩම් ආදායම් 2019 දෙසැම්බර් 31 දිනට රු.18,231,381 ක් වී තිබුණි. | ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | බදු ආදායම් රැස් කිරීමේ කටයුතු වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන බව දන්වමි. |
| (ඈ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කුණ්ඩසාලේ රජයේ ගොවිපලට අයත් භූමියක් 1990 වසරේ සිට 2014 වසර දක්වා වසර 24 ක කාලයක් රාජ්‍ය දැව සංස්ථාව පරිහරණය කිරීම වෙනුවෙන් ලැබිය යුතු බදු කුලිය වන රු.13,200,000 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන ලෙස කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම්දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | මධ්‍යම පළාත් සභාව විසුරුවා හැරීමත් සමඟ ප්‍රධාන අමාත්‍යවරයාට වෙන්කර තිබූ අනගාරික ධර්මපාල මාවතේ පිහිටි මලබාර් හවුස් ගොඩනැගිල්ල ග්‍රාම ශක්ති ව්‍යාපෘතිය වෙනුවෙන් භාරදී තිබුණ අතර නිල නිවාස භාරදීමේ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව රජයේ තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද රු.325,000 ක මාසික කුලියක් අයකර ගත යුතු වුවත් 2019 මාර්තු 15 දින සිට 2019 දෙසැම්බර් 22 දින දක්වා වූ කාලයට අදාළව අයවිය යුතු රු.2,925,000 ක නිවාස කුලිය අයවී නොතිබුණි. | අයවිය යුතු නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කිරීම. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඊ) | උකුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තරුණ බෞද්ධ සමිතියකට දීර්ඝ කාලීනව බදු පදනම මත ලබාදී තිබූ ඉඩමක බදු කාලය 2017 පෙබරවාරි මාසයේදී අවසන් වී ඇතත්, එම දේපල නැවත බදුදීමට හෝ ගිවිසුම් අලුත් කිරීමට හෝ සන්තකය පවරා ගැනීමට හෝ අදාළ සුදුසු කටයුත්තක් කිරීමට කටයුතු කර නොතිබුණි. | නැවත බදු දීමට හෝ ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කිරීම. | 2017 වර්ෂයේ බදුකරය අවසන් වී ඇති අතර, නැවත බදුදීමේ කටයුතු කරමින් පවතී. තක්සේරු වාර්තාව ලැබූ පසු බදුකරය දීර්ඝ කරනු ලැබේ. |
| (උ) | මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු නව ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 1,900 ක් හා පල්ලේකැලේ කෝප්මාට් වෙළඳසැල පිහිටි ගොඩනැගිල්ල, තක්සේරුවකින් තොරව 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කුලියට ලබාදී තිබුණු අතර වර්ග අඩි 683 ක් ගිවිසුමක් හෝ කුලී අයකිරීමකින් තොරව ආයතන 3 ක් වෙත ලබාදී තිබුණි. | රජයේ ගොඩනැගිලි කුලියට දීමේදී තක්සේරුවක් ලබාගෙන වර්තමානයට ගැලපෙන කුලී මුදලක් අයකිරීමට කටයුතු කිරීම. | ගිවිසුම අලුත් කර නොමැති බව පිළිගනිමි. එය යාවත්කාලීන කිරීමටත් වෙනත් ආයතන වෙත ලබාදී ඇති ඉඩ වෙනුවෙන් කුලී මුදල් ලබා ගැනීමටත් කටයුතු කරමි. |

**03.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.32,476,105,845 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.28,974,672,234 ක් විය.

## 04. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

### 4.1 ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම

#### 4.1.1 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග නඩත්තු සඳහා සමාලෝචිත වර්ෂයේ ලද රු.600,000,000 ක ප්‍රතිපාදන මුදලින් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබූ රු.28,230,259 ක් 2019 වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | ප්‍රතිපාදන අදාළ අරමුණට යෙදවීමට කටයුතු කිරීම. | 2019 දෙසැම්බර් Vat සංශෝධනය මත ඉතිරිවූ මුදලකි. |
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 8.3.2 (ආ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ප්‍රසාද දීමනා ලබා ගැනීම සඳහා හිමිකමක් නොමැති වුවද සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා 2017 සහ 2018 වර්ෂවලට අදාළව ප්‍රසාද දීමනා වශයෙන් රු.725,000 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ අභිබවා කටයුතු නොකිරීම. | ආණ්ඩුකාර අනුමැතිය මත ලබාදී ඇත. |
| (ඇ) | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කොන්දේසි අනුව, 2018 වර්ෂයේ ගිවිසුම්ගත කර්මාන්ත 56 කින් අය කළ යුතු ප්‍රමාද ගාස්තුවට වඩා, රු.1,797,310 ක් අඩුවෙන් අයකර තිබුණි. | ප්‍රමාද ගාස්තු නිවැරදිව අයකර ගැනීමට කටයුතු කිරීම. | සෙනසුරාදා, ඉරිදා සහ පෝය දින ආයතනයේ නිවාඩු දින බැවින් එම දින අඩුකර ප්‍රමාද ගාස්තු ගණනය කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පළාත් මාර්ග නඩත්තු වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන්ව තිබූ රු.600,000,000 ක මුදලින් රු.50,625,682 ක් වැටුප් ගෙවීම සඳහා වැයකර තිබුණි. | ප්‍රතිපාදන අදාළ අරමුණට යෙදවීමට කටයුතු කිරීම. | මාර්ග නඩත්තු සඳහා චෙක්රෝල් පදනම මත බඳවාගත් කම්කරුවන් සඳහා මෙයින් වැටුප් ගෙවා ඇත. |
| (ඊ) | 2019 වර්ෂයට මාර්ග නඩත්තු යන්ත්‍ර කුලී වැය විෂයය සඳහා ඇස්තමේන්තුගත වියදම රු.56,000,000 ක් වුවද රු.84,277,163 ක් වැය කර තිබූ බැවින් ඇස්තමේන්තුව ඉක්මවා වැය කළ මුදල රු.28,277,163 ක් විය. | ඇස්තමේන්තු සීමා පිළිපැදීම. | 2017 වර්ෂයේ ලැබිය යුතු යන්ත්‍ර කුලී මිලියන 32 ක් මේ වසරේ මුදලින් අයකිරීම හේතු වී ඇත. |

**4.1.2 මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කටුකිතුල මගී ගිමන්හල බදු දීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය හා කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය එළඹ තිබූ ගිවිසුමට අනුව උපබදු දීම හා ගිමන්හලේ ආකෘතිමය වෙනස්කම් කළ නොහැකි වුවත්, කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය එය වෙනත් පෞද්ගලික ආයතනයකට උපබදු දී තිබූ අතර, එම ආයතනය රු.මිලියන 6 කට ආසන්න මුදලක් වැයකර එහි ආකෘතිය වෙනස් කර තිබුණි. තවද එම ආයතනයෙන් 2013 පෙබරවාරි සිට 2019 දෙසැම්බර් දක්වා අය විය යුතු රු.2,164,390 ක හිඟ බදු මුදල අය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයේ ප්‍රඥප්තියේ 4(9) ඡේදය අනුව ආයතනයේ දෛනික කටයුතු හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඒවාට බලපාන පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සකස් කරගෙන නොතිබූ අතර ප්‍රඥප්තියේ 05 ඡේදය පරිදි බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර අනුමත කර ගෙන නොතිබුණි. | ප්‍රඥප්තිය අනුව කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයේ ප්‍රඥප්තියේ 6.3 වගන්තිය අනුව අතිරික්ත මුදල් සඳහා පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු නොකර 2019 දෙසැම්බර් 31 දින වන විට රු.55,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි. | ප්‍රඥප්තිය අනුව කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය පිහිටුවා ඇති අරමුණට පරිබාහිරව නගර අලංකරණය සඳහා මල් බඳුන් සැපයීම වෙනුවෙන් රු.1,496,660 ක් වැය කර තිබුණි. | ආයතනය පිහිටුවා ඇති අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

### 4.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

### 4.2.1 හැටන් සම්පත් මධ්‍යස්ථානය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් වැටුප් හා දීමනා ලබමින් මෙම ආයතනයේ පූර්ණකාලීනව සේවයේ නියුතු නිලධාරීන් සිව්දෙනෙකු වෙනුවෙන් දරන ලද රු.2,044,319 ක පාරිශ්‍රමිකය එම ආදායම් වියදම් ගිණුමට ගැලපීම් කරනු ලැබුවේ නම් සමාලෝචිත වර්ෂයේ රු.574,833 ක් වූ ඌනතාවය රු.2,619,152 ක් දක්වා වර්ධනය වීමට ඉඩ තිබුණි. | ඌනතාවය අවම කර ගැනීමට කටයුතු කිරීම. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම වූ රු.1,214,128 කින් ආරක්ෂක සේවා ගාස්තු හා පවිත්‍රතා සේවා ගාස්තුව වෙනුවෙන් දරන ලද රු.1,477,766 ක වියදම හෝ පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | වියදම් පාලනය සඳහා විකල්ප ක්‍රම අනුගමනය කිරීම. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | 2012 සිට 2019 දක්වා කාලය තුළ මෙම ආයතනයේ ආදායම් ලැබීම් 2012 වර්ෂයට සාපේක්ෂව වරින් වර සියයට 27 සිට සියයට 65 ක් දක්වා වූ ප්‍රතිශතයකින් පිරිහී තිබුණ ද, කළමනාකාරීත්වය මේ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිරිවැය අවම කර ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

### 4.2.2 කෘෂිරෝපන ද්‍රව්‍ය අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් පවත්වාගෙන යනු ලබන මෙම අත්තිකාරම් ගිණුම තුළින් මධ්‍යම පළාතේ ගොවීන් සඳහා උසස් තත්ත්වයේ කෘෂි බීජ හා රෝපණ ද්‍රව්‍ය මිලදීගෙන ලබාදීම අරමුණු කරගෙන තිබුණ ද, එම අමාත්‍යාංශය යටතේ වන පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ද එම කටයුත්ත සඳහාම රු.9,710,427 ක් වූ බීජ හා රෝපණ ද්‍රව්‍ය සියයට 50 දායකත්වය යටතේ ගොවීන් වෙත ලබාදී තිබුණි. | අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අරමුණට අනුව කටයුතු කිරීම. | මීට වසර ගණනාවකට පෙර කැබිනට් පත්‍රිකාවක් මඟින් උපරිම මූල්‍ය සීමාව රු.815,000 ක් බවට තීරණය කර ඇත. එබැවින් ගොවීන්ගේ රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවය තිබුණද තීරණය කර ඇති උපරිම මූල්‍ය සීමාව අභිබවා කටයුතු කිරීමට හැකියාවක් නොමැත. |

### 4.2.3 ගල්පාලම ගොවිපල අත්තිකාරම් ගිණුම

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කෘෂි කර්මාන්තයේදී රසායනික පොහොර භාවිතය අවම කිරීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා ගොවිපලේ වගාවන් සඳහා 2012 වර්ෂයේදී රසායනික පොහොර භාවිත කර නොතිබුණ ද, 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රසායනික පොහොර මිලදීගැනීම රු.61,750 සිට රු.516,965 දක්වා පරාසයකින් වර්ධනය වී තිබුණි. | රසායනික පොහොර භාවිතය අවම කිරීමට අවධානය යොමු කිරීම. | දැනට වෙළඳපොළේ පවතිනුයේ අස්වනු ලබා දෙන දෙමුහුම් විදේශීය බීජ වර්ග වේ. මේවා සඳහා පෝෂක අවශ්‍යතාවය ඉතා වැඩි වේ. |
| (ආ) | ගොවිපල සතුව මුළු ඉඩම් වපසරිය අක්කර 23 ක් වුවද ඉන් අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළව ආදායම් ඉපැයීම වෙනුවෙන් අඛණ්ඩව යොදවා තිබූ වගා ඉඩම් ප්‍රමාණය අක්කර 14 කට සීමාවී තිබුණි. | වගාකළ හැකි උපරිම භූමි ප්‍රමාණය උපයෝජනය කර ගොවිපල් ආදායම වර්ධනය කරගැනීමට කටයුතු කිරීම. | ඉදිරියේදී මේ පිළිබඳ අවධානය යොමුකරවා භූමි ඵලදායිතාවය වැඩි කරගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ වසර මුළුල්ලේම වගාවන් සිදුකළ හැකි වුවද ගල්පාලම ගොවිපලේ වර්ෂයකට එක් කන්නයක පමණක් බෝග වගාකරන හෙයින් වගාකළ හැකි සම්පත් ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණක් ප්‍රයෝජනයට ගැනීම නිසා වසරේ ඉතිරි කාලයේ එම සම්පත් නිෂ්කාර්යව පැවතුණි. | වසර මුළුල්ලේම වගාවන් සිදුකර භූමියෙන් උපරිම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. | අළුතින් කම්කරුවන් ලබාදෙන මෙන් ඉල්ලුම් කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී වගා කළ හැකි භූමි ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි කිරීමට කටයුතු කරමි. |

### 4.2.4 පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඖෂධ සැපයීමේ අත්තිකාරම් ගිණුම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඖෂධ ඇස්තමේන්තු විධිමත්ව පිළියෙල නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂය අවසානයට රු.4,938,477 ක් වූ අවසන් තොගයක් පැවතියදී සමාලෝචිත වර්ෂය තුළදී රු.5,277,523 ක් වටිනා ඖෂධ මිලදීගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට මුළු තොග පිරිවැයෙන් සියයට 34 ක් වූ රු.3,518,722 ක් වටිනා තොග උපයෝජනයෙන් තොරව පැවතුණි. | වාර්ෂික අවශ්‍යතාවය මත මිලදී ගැනීම් කළ යුතු වේ. | ඖෂධ මිලදී ගැනීම සඳහා වර්ෂය මුලදී මාස 02 ක පමණ කාලයක් ගතවන බැවින්, එම කාලය තුළ සතුන්ට ප්‍රතිකාර කිරීම අඛණ්ඩවම සිදුකළ යුතු බැවින් ආරක්ෂිත තොගයක් පවත්වා ගැනීම පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් සිදු වේ. |
| (ආ) | පේරාදෙණිය පශු රෝහලට ප්‍රතිකාර සඳහා රැගෙන එන සතුන්ගේ ඖෂධ අවශ්‍යතාවය සපුරාලීම මෙම අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අරමුණ වුවත් විධිමත් නෛතික භාවයකින් තොරව සේවක සුභසාධක සමිතිය මඟින් පශු ඔසුසල පවත්වාගෙන යමින් පැවතීම, මෙම අත්තිකාරම් කටයුත්තට අදාළව වර්ෂ ගණනාවක සිට වෙන් වූ ප්‍රතිපාදන සීමා උපයෝජනය අඛණ්ඩව දුර්වල මට්ටමකට පත්වීමට හේතු වී තිබුණි. | අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අරමුණට ළඟාවීමට ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම. | ඖෂධ පරිහරණය සම්බන්ධව වඩා විනිවිද භාවයෙන් යුක්ත විධිමත් සැලැස්මක් සකස් කිරීම සඳහා සටහන් තබාගත් බව දන්වමි. |

**4.3** **අනෙකුත් අත්තිකාරම් ගිණුම්**

**------------------------------**

**පළාත් රාජ්‍ය නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**--------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 2894 කගෙන් ලැබිය යුතු රු.76,230,006 ක් වූ ණය ශේෂය හා ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 1059 දෙනෙකුගේ පියවිය යුතු රු.30,889,780 ක් වූ ණය ශේෂය ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම හා පැරණි ණය ශේෂ පිළිබඳ පළාත් භාණ්ඩාගාර උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කිරීම. | චෙක්පත් මඟින් හා කලාප අතර ස්ථාන මාරු වූ නිලධාරීන් 49 දෙනෙකුගේ රු.4,338,150 ක ණය ශේෂ 2020 ජුනි 30 දින වන විට නිරවුල් කර ඇත. ඉතිරි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අයවිය යුතු මුළු ණය ශේෂයෙන් වසර 1 සිට වසර 23 අතර කාලයක් තුළ අයකර ගෙන නොතිබූ ණය ශේෂයේ වටිනාකම රු.67,740,684 ක් වූයෙන් එය මුළු ණයගැති ශේෂයෙන් සියයට 89 ක් වූ අතර පියවිය යුතු මුළු ණය ශේෂයෙන් වසර 1 සිට 23 අතර කාලයක් පියවා නොතිබූ ණය ශේෂයන්ගේ වටිනාකම රු.26,176,217 ක් විය. එය මුළු ණයහිමි ශේෂයෙන් සියයට 85 ක් විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම හා පැරණි ණය ශේෂ පිළිබඳ පළාත් භාණ්ඩාගාර උපදෙස් අනුගමනය කිරීමට කටයුතු කිරීම. | චෙක්පත් මඟින් හා කලාප අතර ස්ථාන මාරු වූ නිලධාරීන් 49 දෙනෙකුගේ රු.4,338,150 ක ණය ශේෂ 2020 ජුනි 30 දින වන විට නිරවුල් කර ඇත. ඉතිරි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 259 කට අදාළව අයවිය යුතු ණය ශේෂය රු.11,173,799 ක් වූ අතර එම ශේෂය තුළ ඇතුළත් වසර 05 ට වැඩි ණය ශේෂය රු.1,694,649 ක් විය. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කර ණය අයකර ගැනීමට හා ණය ශේෂ නිරවුල් කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම. | නිලධාරීන් කිහිප දෙනෙකුගේ ණය ශේෂ පියවීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලැබී ඇති අතර එක් නිලධාරියෙකුගේ ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් අයකර ඇත. අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ තහනම් කළ හා සේවය අතහැරගිය නිලධාරීන් 144 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.5,439,775 ක් වූ අතර මෙහි වර්ෂ 05 ඉක්මවූ රු.3,392,787 ක ශේෂයක් ඇතුළත්වී තිබුණි. | අයනොවන ණය ශේෂ සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වර්ෂ ගණනාවක සිට පවතින රු.6,596,211 ක එම වෙනස තුළ වත්තේගම හා වලපනේ කලාප කාර්යාලවල පවතින පිළිවෙළින් රු.5,815,894 ක හා රු.1,652,050 ක සාවද්‍ය හර වටිනාකම් නිවැරදි කර නොතිබුණි. එමෙන්ම ආයතන 07 ක වැඩිපුර අයවීම් රු.988,789 ක් හා කලාප 02 ක රු.117,055 ක වැඩිපුර ගෙවීම් ද නිවැරදි කර ගැනීමට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | වැරදි හර හා බැර නිවැරදි කිරීමට කටයුතු කිරීම. | සාවද්‍ය හර ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |

## 05. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්යසාධනය

### 5.1.1 රජයේ ප්‍රදාන

| | මූලාශ්‍රය | අනුමත මුදල | වැය කළ මුදල | ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 1,792.51 | 1,767.39 | 25.12 |
| (ආ) | උපමාන පාදක ප්‍රදාන (CBG) | 164.05 | 154.62 | 9.43 |
| (ඇ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (අධ්‍යාපන) | 110.00 | 106.84 | 3.16 |
| (ඈ) | විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති ප්‍රදාන (සෞඛ්‍ය) | 81.06 | 40.57 | 40.49 |
| | එකතුව | 2,147.62 | 2,069.42 | 78.20 |

### 5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ අනුමත කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 2,147.62 ක නව වැඩ හා අවිච්ඡේද වැඩ 2504 ක ප්‍රගතිය පහත පරිදි විය.

| | විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද යෝජනා වැඩ ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|---|
| | | | | | රු. මිලියන |
| (අ) | සම්පූර්ණයෙන් නිමකළ | 2254 | 156 | 2410 | 1,831.80 |
| (ආ) | 50% කට වඩා අඩුවෙන් නිමකළ | 32 | 6 | 38 | 301.48 |
| (ඇ) | 50% කට වඩා වැඩියෙන් නිමකළ | 38 | 11 | 49 | 287.70 |
| (ඈ) | ආරම්භ කර නොතිබූ | 6 | 1 | 7 | - |
| | | 2330 | 174 | 2504 | 2,420.98 |

සමාලෝචිත වර්ෂයට අදාළව යාවත්කාලීන කරන ලද සංවිධාන සටහන, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය, අයවැය ප්‍රමුඛතාවය, ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව, ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල හා වාර්ෂික අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් එක් එක් විසර්ජන ශීර්ෂයන් වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

## 5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1991 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 08 කදී සමුපකාර අරමුදලින් ලබාදුන් රු.1,025,000 ක ණය මුදල් අයකර නොතිබුණු අතර සමුපකාර සමිති 2 කට ලබාදී ඇති රු.2,080,500 ක ණය මුදල් අයවීමේ මන්දගාමී තත්ත්වයක් පැවතුණි. | ණය ආපසු ගෙවීම පැහැර හරින්නේ නම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම. | ණය අයකර ගැනීමේ ගැටළුවක් පවතී. ඈවර කටයුතු කරමින් පවතින සමිතිවල ඈවර මුදලින් පියවා ගැනීමටත් ඈවර කර අවසන් සමිති 5 ක ණය කපාහැරීමට අනුමැතිය ලබාගැනීමටත් කටයුතු කරමි. |
| (ආ) | සමුපකාර කොමිෂන් සභා රෙගුලාසිවලට පටහැනිව සේවක පත්කිරීම් සිදුකිරීම හා අවුරුදු 60 ට වැඩි සේවකයන් තනතුරුවල සේවයේ යෙදවීම වැනි කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභා නියෝග දී තිබුණ ද ඒවා ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නියෝග ක්‍රියාත්මක නොකරන්නේ නම් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම. | නැවත සමිති දැනුවත් කිරීම හා නීති මඟින් කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සිසුන් අඩුවීම මත 2001 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ නාඋල කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල් 08 ක් වසා දමා තිබුණි. | අදාළ පාසල්වල සේවය කරන ගුරුභවතුන් වෙනත් පාසල් සඳහා අනුයුක්ත කිරීම හා පවතින වත්කම් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | (i) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක කුඩා ජල විදුලි බලාගාර 13 කින් 2019 වර්ෂයේ ජල බදු වශයෙන් රු.2,290,794 ක් අයකර තිබුණු අතර අදාළ සමාගම් එම වර්ෂය තුළ නිපදවන ලද විදුලිය කිලෝවොට් 54,782,382 ක් වෙනුවෙන් රු.848,269,441 ක ආදායමක් උපයා තිබුණි. ජල බදු අය කිරීමේ නීති කාලීනව සංශෝධනය නොකිරීමේ හේතුවෙන් ඉපයූ ආදායමට සාපේක්ෂව අයකර තිබූ ජල බදු ප්‍රමාණය සියයට 0.27 ක් ව තිබුණි. | බලාගාර විසින් නිෂ්පාදනය කරන විදුලි ඒකක ප්‍රමාණය මත බදු අය කිරීමට කටයුතු කිරීම. | රජයේ ඉඩම් ආඥා පනතේ බදු කුලී සංශෝධනය සම්බන්ධයෙන් වූ 2010/02 චක්‍රලේඛය අනුව හා පළාත් ඉඩම් කොමසාරිස්ගේ CLP/LC/LD/6/AP/1/2/3 හා 2020 ජනවාරි 13 දිනැති ලිපිය අනුව කටයුතු කර ඇත. |
| | (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ලේඛන ගත වීමක් සිදුවී නොතිබුණු කුඩා ජල විදුලි බලාගාර 04 ක් 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ විදුලිය කිලෝවොට් 8,430,932 ක් නිෂ්පාදනය කර රු.118,033,048 ක ආදායමක් උපයා ඇති නමුත් උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි. | හිඟ බදු මුදල් අය කිරීමට කටයුතු කිරීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ විදුලි බලාගාර ලේඛන ගත කළ යුතු වේ. | එක් බලාගාරයක් සඳහා මහවැලි අධිකාරියෙන් බදු අයකළ යුතු වේ. තවත් බලාගාරයක් සඳහා බදු අය කිරීමට කටයුතු සිදු කරමින් පවතින අතර, එක් සමාගමක් විසින් 500Kw එක් බලාගාරයක් පමණක් පවත්වාගෙන යන බව හා නිරීක්ෂණ වාර්තාව ලබා ගැනීමට කටයුතු කළ පසු අනෙක් බලාගාරයෙන් බදු අයකිරීමට බලාපොරොත්තු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) (i) | උඩපළාත, පන්විල හා මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් පාසල් 04 ක ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2011 අගෝස්තු සිට 2019 ජූනි දක්වා කාලය තුළ දී රු.2,187,455 ක මුදලක් ලැබී තිබුණ ද, 2020 ජනවාරි වන විටත් අදාළ ඉඩම් අත්පත් කර ගෙන නොතිබුණි. | අදාළ ඉඩම් පවරා දීමට කටයුතු කිරීම. | උඩපළාත පාසල් 02 හි ඉඩම් අත්පත් කර ගැනීමට නියමය ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මඟින් ලැබිය යුතු වේ. පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අදාළ ඉඩම් වැවිලි සංස්ථාව සතු ඉඩමක් ලෙස හඳුනාගෙන ඇත. මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඉඩම් අමාත්‍යාංශය වෙත අදාළ අත්පත් යෝජනාව ඉදිරිපත් කර නොමැත. |
| (ii) | මධ්‍යම පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක පාසල් 17 ක ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.14,616,574 ක මුදල් යවා වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් ගතවී තිබුණත් එම කටයුතු අවසන්ව නොතිබුණි. | සාකච්ඡා කර මෙම ක්‍රියාවලිය විධිමත් කර ගැනීමට හැකි ක්‍රමයක් සකසා ගැනීම. | මුදල් තැන්පත් කිරීමට පෙර අත්පත් යෝජනා ඉදිරිපත් කිරීමට පනත අනුව විධිවිධාන නොමැත. |
| (iii) | පාසල් 37 ක පවරාගත යුතු ඉඩම්වල වටිනාකම රු.197,375,000 කට ඇස්තමේන්තු කර ඇතත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අත්පත් කර ගැනීමේ ඉදිරි පියවර ගෙන නොතිබුණි. | අදාළ අංශ දැනුවත් කර හැකි ඉක්මනින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කිරීම. | ප්‍රතිපාදන ලබා ගැනීමටත් ලැබෙන ප්‍රතිපාදන එකවර ගෙවීමෙන් අත්පත් කරගත හැකි පාසල් ඉඩම් සඳහා ප්‍රමුඛතාවය දීමටත් කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | දිස්ත්‍රික්ක 03 හිම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 36 ක ඉඩම් දීර්ඝ කාලීනව බදු දීමේ ලිපිගොනු 3,220 ක කටයුතු යාවත්කාලීන වී නොතිබීම නිසා බදු කාලය අවසන් වූ ලිපිගොනුවල ඉදිරි කටයුතු සිදු නොකිරීමෙන් නීත්‍යානුකූල නොවන ලෙස රජයේ ඉඩම් පරිහරණයට ඉඩ සැලසී තිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් ඉඩම් කට්ටි 81 ක අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලිපි ගොනු යාවත්කාලීන කර හිඟ බදු මුදල් අයකර ගැනීම හා අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කිරීම. | පැරණි දීර්ඝකාලීන බදු ගොනුවල කටයුතු යාවත්කාලීන නොවීම පිළිගනිමි. |
| (උ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් ආයතන සතු ඉඩම් ඒකක 30 ක නීත්‍යානුකූල අයිතිය සනාථ කිරීමට නොහැකි වීම නිසා ඒවා පරිහරණය කරනු ලබන රජයේ ආයතන වෙත පවරා දීමට නොහැකි වී තිබුණි. | නීත්‍යානුකූල අයිතිය සනාථ කරගෙන කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම. | දැනට ග්‍රාම නිලධාරී මට්ටමෙන් දත්ත එක් රැස් කරමින් පවතින අතර අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීමේ දී තක්සේරු, මිනින්දෝරු වැනි දෙපාර්තමේන්තු හා ඉඩම් අමාත්‍යාංශය වැනි ආයතන හා සම්බන්ධ වීමේදී ප්‍රමාදයන් සිදු වේ. |

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නාවලපිටිය ශාන්ත ඇන්ඩෘ බාලිකා විද්‍යාලයේ 2005 වර්ෂයේ ඉදිකරන ලද දෙමහල් ගොඩනැගිල්ලේ පළමු මහල ඉදිකර වර්ෂ 14 ක් පමණ ගතවී තිබූ නමුත් එහි දෙවන මහල ඉදිකර නොතිබීම හේතුවෙන් වැසි අවස්ථාවලදී පන්ති කාමරවලට වතුර කාන්දුවීම සිදුවීම නිසා එම ගොඩනැගිල්ලේ අධ්‍යාපනය හදාරන සිසුවියන් දැඩි අපහසුතාවයකට ලක්වී තිබුණි. | මහල් කිහිපයකින් යුත් ගොඩනැගිලි කොටස් වශයෙන් ඉදිකිරීමේදී කල් නොයවා අවසන් කිරීමට කටයුතු කිරීම. | මහනුවර දිස්ත්‍රික් ඉංජිනේරු මඟින් මිල ගණන් කැඳවා වහලය සැකසීමට පියවර ගන්නා බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රජතලාව කණිෂ්ඨ විද්‍යාලයේ නල ළිඳට සවිකරන ලද ජල මෝටරය අළුත්වැඩියා කර නොගැනීම හා අක්‍රීය වූ සූර්ය කෝෂ 02 අළුත්වැඩියා කර නොගැනීම නිසා රු.ලක්ෂ 65 කට ආසන්න පිරිවැයක් දරා විදේශීය ආධාර යටතේ විද්‍යාලයට ලබාදී තිබුණු ජල පද්ධතිය වසර 03 ක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | දරන ලද වියදම් නිශ්කාර්ය වීමට ඉඩනොහැර ගුරු හා සිසු අවශ්‍යතා සපුරා දීමට පියවර ගැනීම. | මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්තුමාට හා නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ ඉංජිනේරු සේවා (පා.ගො.) වෙත දන්වා ඇත. |
| (ඇ) | 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සිසුන් 990 ක් අධ්‍යාපනය ලබන හඟුරන්කෙත සී.සී. විද්‍යාලයේ ගොඩනැගිලි 03 දුම්කොළ සමාගමක් විසින් දුම්කොළ වියළීම සඳහා යොදාගෙන තිබුණු තහඩු සෙවිලි කළ වා කවුළු නිසි පරිදි නොමැති උසින් අඩු ගොඩනැගිලි බැවින් සිසු දරුවන් දැඩි අපහසුතාවයන් මධ්‍යයේ අධ්‍යයන කටයුතු සිදු කරමින් පැවතුණි. | අවම භෞතික පහසුකම්වත් සැලසීමට කටයුතු කිරීම. | පිළිගනිමි. |
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන - 2016 යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ, කිඹිස්ස සහ නාලන්ද කෘෂි උපදේශක කොට්ඨාශ තුළ හෙළ බොජුන්හල් 03 ක් ඉදිකිරීම සඳහා රු.11,866,202 වැය කර තිබුණු නමුත් අලෙවි කටයුතු සඳහා 2018 වර්ෂයේ සිට තෝරාගත් ව්‍යවසායකයින් සමඟ විධිමත් වූ ගිවිසුමකට එළඹ නොතිබීමෙන් ගාස්තුවක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | බාහිර පාර්ශවයන් වෙත රජයේ වත්කම් ලබාදීමේදී නීත්‍යානුකූලභාවයක් තිබිය යුතු අතර රජයට වාසිදායක වන අයුරින් ආදායමක් ලබා ගැනීමට කටයුතු කිරීම. | දෙපාර්තමේන්තුව හා ව්‍යවසායකයන් සමඟ ගිවිසුම් ගත වීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2019 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව කෘෂිකර්ම දෙපාර්මේන්තුව විසින් රු.මි 2.8 ක ප්‍රතිපාදන යටතේ කෘතිම සිංචන 63,150 ක් සිදුකිරීම සඳහා සැලසුම් කර තිබූ නමුත් රු. මි.2.33 ක් වැය කර කෘතිම සිංචන 53,128 ක් පමණක් සිදුකර තිබුණු අතර ගැබ් පරීක්ෂා හා උපත් පරීක්ෂා පිළිවෙළින් අවස්ථා 13,000 ක් හා 14,345 කට සීමා වී තිබුණි. ඒ අනුව සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් හා කෘත්‍රිම සිංචන නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද කෘතිම සිංචනවලින් ගැබ් පරීක්ෂණ හා උපත් පරීක්ෂාවේ පසු විපරම් ප්‍රගතිය සියයට 24 හා සියයට 27 ක් වූ පහල මට්ටමක පැවතුණි. | දෙපාර්තමේන්තු සත්ත්ව සංවර්ධන උපදේශක නිලධාරීන් කෘතිම සිංචන කටයුතු, කෙරෙහි දක්වන දායකත්වය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගැනීම තුළින් එහි කාර්යසාධනය වර්ධනය කිරීම, පසු විපරම් කටයුතු වැඩිකිරීම සහ ගොවීන් දැනුවත් කිරීමේ අභ්‍යන්තර වැඩ පිළිවෙළක් සකස් කිරීම. | 2019 වර්ෂය තුළදී කෘතිම සිංචන 53,128 ක් සිදුකර ඇති අතර ශ්‍රී ලංකාවේ පවතින දත්තවලට අනුව සඵලත්වය 1/3 ක් වන බැවින් උක්ත සිංචන සංඛ්‍යාවෙන් අපේක්ෂා කළ හැකි ගැබ් ගන්නා දෙනුන් සංඛ්‍යාව 17,709 පමණ වේ. එම දෙනුන් 17,709 ට බිහිවූ පැටවුන්ගෙන් උපත් 14,345 ක් එනම් 81% ක ප්‍රතිශතයක් වාර්තා කිරීමට හැකිවී ඇත. ගැබ් පරීක්ෂණ සඳහා 27,170 ක වාර්ෂික ඉලක්කයක් ලබාදී ඇති අතර එයින් 13,000 ක් එනම් සියයට 48 ක ප්‍රතිශතයක් අත් කර ගැනීමට සමත්වී ඇත. |
| (ඊ) | මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ පිහිටුවා තිබූ තත්ත්ව පාලන පර්යේෂණාගාරයට 2008 වර්ෂයේ මිලදීගත් රු.2,702,500 ක් වටිනා තත්ත්ව පරීක්ෂණ උපකරණ 3 ක්, කිසිදු පරීක්ෂණයකට යොදාගෙන නොතිබුණි. | නිලධාරීන් පුහුණු කර උපකරණවලින් ප්‍රයෝජන ලබා ගැනීම. | අදාළ නිලධාරීන් නොමැති වීම හා ප්‍රතිපාදන වෙන් නොවීම මත නිලධාරීන් පුහුණු කිරීමට නොහැකි වීම මත මෙම උපකරණ ප්‍රායෝජනයට ගැනීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (උ) | මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ වාස්තු විද්‍යා අංශයට 2016 සිට 2018 දක්වා ලැබී තිබූ තත්ත්ව පාලන පරීක්ෂණ ඉල්ලීම් සංඛ්‍යාව හා නිම කළ ඉල්ලීම් සංඛ්‍යාව අනුව කාර්යසාධනය සියයට 31 සිට සියයට 44 දක්වා අඩු මට්ටමක පැවතුණි. | කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කිරීම. | ලැබෙන ඉල්ලීම්වලට අදාළ ප්‍රතිපාදන නොලැබීම මත අවලංගු වීම හා වර්ෂය අවසානයේ ලැබෙන ඉල්ලීම් ඊ ළඟ වර්ෂයේ නිමකර ඇත. |
| (ඌ) | මාතලේ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් වෙත එක් එක් තැපැල් කාර්යාලවලින් එවන ලද රු.733,800 ක නොගෙවූ මහජන ආධාර හා රෝගාධාර සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කර නොතිබුණි. | තැපැල් ස්ථානාධිපතිවරුන් විමසා පසු විපරම් කිරීමට කටයුතු කිරීම. | මහජනාධාර , රෝගාධාර දීමනා ගෙවීමෙන් පසු අදාළ ලේඛන කාර්යාලයට ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ලබා නොගත් ආධාරලාභීන් තහවුරුකර ගැනීම අපහසු වී ඇත. |
| (එ) | මධ්‍යම පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමූපකාර සමිති 1,555 න් සමිති 781 ක් අක්‍රිය සමිති බවට පත්ව තිබූ අතර පළාත් සමූපකාර දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ විගණනයන් 655 ක් නිමකිරීම සඳහා සැලසුම් කළද වර්ෂය අවසාන වනවිට 478 පමණක් නිමකර තිබුණි. | නව සමිති ලියාපදිංචි කිරීමේදී මේ පිළිබඳ සැලකිලිමත් වීම. | විවිධ වැඩසටහන් වෙනුවෙන් ආරම්භ කළ සමූපකාර සමිති වැඩසටහන් අවසන්වීමත් සමගම අක්‍රියවීම සිදුව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ ලියාපදිංචිය අහෝසි කර අවු. 6 ත් 27 ත් අතර කාලයක් ගතවුවද ඇවර කටයුතු අවසන් නොවූ සමිති ගණන 36 ක් වූ අතර ඇවර කටයුතු සඳහා හිමිකම් පෑමට ප්‍රසිද්ධ කර අවුරුදු 03 ක් ගතවී ඇතත් ඇවරකරුවන් පත්කර නොතිබුණු සමිති ගණන 47 ක් විය. එසේම සමිති 96 ක ලියාපදිංචිය අවලංගු කළ බව 2018 ජුලි 09 දින දැන්වීම් පළකර තිබුණ ද හිමිකම් පෑම සඳහා නිවේදන නිකුත් කර නොතිබුණි. | සමිති ඇවර කිරීමේ කටයුතු කල්නොයවා අවසන් කිරීම. | නිලධාරී පුරප්පාඩු පැවතීම ඇවර කටයුතු සඳහා කල්ගතවීමට හේතුවී ඇති අතර හිමිකම් පෑමේ නිවේදන නිකුත් කිරීමට 2019.10.14 දින යොමුකර ඇත. |
| (ඔ) | මහනුවර දිස්ත්‍රික් කාර්යාලයේ තීරක කටයුතු අවසන් නොවූ ආරවුල් ගණන 1,253 ක් වුවද තීරක කටයුතු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් 58 දෙනෙකුගෙන් නිලධාරීන් 13 දෙනෙකු තීරක කටයුතු සඳහා යොමුකර නොතිබුණි. | සුදුසුකම් සහිත නිලධාරින් සියලු දෙනා යෙදවිය හැකි වැඩපිළිවෙළක් සකසා තීරක කටයුතු අවසන් කිරීම. | සුදුසු නිලධාරීන් සිටියද ඇතැම් නිලධාරින්ට කාලය ගත කිරීමට නොහැකි අවස්ථාවලදී තීරක විභාග කටයුතුවල නොයෙදේ. |

## 5.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව සතු වත්කමක් වන රාජ්‍ය නර්තන කණ්ඩායම සඳහා 2019 වර්ෂයේ රු.3,400,000 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි. නර්තන කණ්ඩායම බාහිරට ලබාදීම වෙනුවෙන් කරන අයකිරීම් ගිණුම්ගත කිරීම අනිවාර්ය වුවද 2019 වර්ෂයේ කුලියට ලබා දී තිබුණු අවස්ථා 35 කින් 11 ක් සඳහා ලැබුණු එකතුව රු.326,975 ක් පමණක් ගිණුම්ගත වී තිබුණි. | බාහිර පාර්ශ්වයන්ට සේවා සැපයීමේදී රජයට ආදායමක් ලැබිය යුතු අතර සියලු අයවීම් ගිණුම්ගත කිරීමටද කටයුතු කිරීම. | ඉදිරියේදී ලබාදෙන මුදලින් සියයට ගණනක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දඹුල්ල මහ රෝහලේ 2019 වර්ෂයේ හදිසි ප්‍රතිකාර ඒකකයේ පවත්වාගෙන යනු ලැබූ ලේඛනය අනුව 2019 ජනවාරි සිට 2019 ජූනි 12 දක්වා ජලභීතිකාව වැලැක්වීමේ එන්නත් ලබාදී තිබුණු විදේශීය රෝගීන් 45 ක් අතුරින් රෝගීන් 28 දෙනෙකුගෙන් රෝහල් ප්‍රතිකාර හා සේවා ගාස්තු අයකරගෙන නොතිබුණි. | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ උපදෙස් මත කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

**5.5** **අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභා රැස් කිරීමේ ජංගම ගිණුම් 06 ක සහ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රධාන ජංගම ගිණුම් 02 ඇතුළත්ව ගිණුම් 08 ක 2019 වර්ෂයේ රු.1,857,991,945 ක් නිශ්කාර්යව පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රාජ්‍ය බැංකු 02 ක පවත්වාගෙන ගොස් තිබූ රු.2,481,656,658 ක ස්ථාවර තැන්පතු පළාත් සභා අරමුණු ඉටුකර ගැනීමට යොදාගෙන නොතිබුණි. | පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු මුදල් අප්‍රමාදව ගෙවීමට කටයුතු කිරීම. | ස්ථාවර තැන්පතුවල තැන්පත් කර ඇත්තේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල දේපල පැවරීම මත අයවන මුද්දර බදු මුදල් වේ. මේවා මධ්‍යම පළාත් භාණ්ඩාගාරය වෙත ලැබෙන අතර රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තු වාර්තා ලද පසු අදාළ පළාත් පාලන ආයතන වෙත මුදාහල යුතු බැවින් එම මුදලින් කොටසක් ස්ථිර තැන්පත් ලෙස තැන්පත් කර ඇත. |

## 5.6 හඳුනා ගන්නා ලද පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ තවදුරටත් අයකර ගැනීමට පවතින රු.19,366,866 ක වටිනාකමැති හානි පාඩු සිද්ධි 198 ක් පැවති අතර එයින් රු.6,822,609 ක වටිනාකමැති සිද්ධි 56 ක් වසර 05 ත් 10 ත් අතර ඒවා වූ අතර රු.3,342,620ක් වටිනාකමැති සිද්ධි 45 ක් වසර 10 ට වැඩි සිද්ධි විය. දීර්ඝ කාලයක සිට පවතින මෙම හානි පාඩු අයකර ගැනීමට හෝ කපාහැරීමට පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කිරීම. | මු.රෙ. 104(4) පරීක්ෂණ හා අධිභාර අයකර අවසන් වී නොමැත. |
| (ආ) | වසර 4 කට හා වසර 11 ක කාලයකට පෙර අනතුරට ලක්වී තිබුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 02 ක පරික්ෂණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන්ව නොතිබූ අතර දැල්පිටිය කෘෂිකර්ම උපදේශක කාර්යාලය, බෝවල සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය හා කුණ්ඩසාලේ පශු වෛද්‍ය කාර්යාලයේ එකතුව රු.1,332,257 ක් වූ අලාභ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පාඩු හා හානි සම්බන්ධයෙන් මූ.රෙ. 104 පරීක්ෂණ කාල ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කර එම වාර්තා අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම. | එක් හානියක් සම්බන්ධව අදාළ හානිය රක්ෂණය මඟින් ප්‍රතිපූරණය කර ඇති අතර හානි හා පාඩු පරීක්ෂණ අවසන් වී නොමැත. ඒ නිසාවෙන් තවදුරටත් අයවිය යුතු අගය පොතට ඇතුළත් වී ඇත. අනෙක් වාහනයේ අදාළ මුදල ගෙවන ලෙස සේවක මහතා දැනුවත් කර ඇත. විනය නියෝගයට එරෙහිව සේවක මහතා මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. |

## 5.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තෙල්දෙණිය දිස්ත්‍රික් මූලික රෝහලේ 2017 හා 2018 වර්ෂවලදී රු.මිලියන 370 ක් වැය කර ඉදිකරන ලද නව වාට්ටු සංකීර්ණයේ ජල කාන්දු වීම් හා මළ අපද්‍රව්‍ය නල පද්ධතියේ අඩුපාඩු පැවති අතර සදලු තළවලට වැටෙන වර්ෂා ජලය ද කොන්ක්‍රීට් තට්ටුව හරහා පහළට වැටීම වැලැක්වීමට රු.2,854,274 ක් වැය කර අමානෝ තහඩුවලින් කරන වහලවල් දෙකක් සවිකර තිබුණි. | සුදුසුකම්ලත් නිලධාරීන් ලවා පරීක්ෂාකර තව දුරටත් තහවුරු කරගෙන ඉදිරි කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

## 5.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

### 5.8.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | නුවරඑළිය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017 හා 2018 වර්ෂවල පිළිවෙළින් රු.109,334,000 ක් රු.50,000,000 ක් වෙන්කර තිබූ අතර වැය කිරීම් පිළිවෙළින් රු.600,000 ක් හා රු.206,874 ක් විය. මෙම ව්‍යාපෘතිය නියමිත පරිදි නිම නොකිරීම නිසා පැරණි නිකේතනය භාවිතා කිරීමේ අවස්ථාවද අහිමි වී තිබුණි. පැරණි නිකේතනය අළුත්වැඩියා කිරීමට සමාලෝචිත වර්ෂයට රු.1,000,000 ක් ප්‍රතිපාදනය කර ඉන් රු.118,573 ක් වැය කර තිබූ අතර මේ වන විට එයද නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ඉඩම් පවරා ගැනීමට කටයුතු කිරීම. | මෙහි භූමිය පවරාදීම සිදුවී නොමැත. ඉඩම පවරාදීමේ ප්‍රමාදය නිසා ඉදිරි කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. අත්‍යාවශ්‍ය අළුවැඩියා කටයුතු සඳහා මුදල් වැයකර ඇති බැවින් එය නිශ්කාර්ය වියදමක් නොවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගැටඹේ සංචාරක හා කර්මාන්ත ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා 2017 හා 2018 වර්ෂවල පරිපූරක ඇස්තමේන්තු මඟින් පිළිවෙළින් රු.900,000,000 ක් රු.65,000,000 ක් වෙන්කර තිබුණු අතර, පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා 2017 වර්ෂයේ අවස්ථා 2 කදී රු.208,610 ක් හා 2018 වර්ෂයේ රු.176,194 ක් වැයකර තිබුණි. ඒ අනුව 2017, 2018 වර්ෂ දෙකෙහිදීම පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා පමණක් වියදම් දරා තිබූ අතර මෙම ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි. | පූර්ව අධ්‍යානයකින් සැලසුම් සකස් කිරීමෙන් පසු ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කිරීම. | Design & build ප්‍රසම්පාදන කාර්ය යටතේ කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට තෙවරක් පුවත්පත් දැන්වීම් පළ කළ ද සුදුසුකම් සපුරා තිබුණු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට නොහැකි විය. |

### 5.8.2 අරමුණෙන් බැහැර ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2018 විශේෂ ආර්ථික යටිතල පහසුකම් නගාසිටුවීමේ වැඩසටහන යටතේ විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙසෙන වකුගඩු රෝගීන් 103 කට ලීටර් 500 ජල ටැංකි ලබාදීම සඳහා රු.478,900 ක වියදමක් දරා ජල ටැංකි 103 ක් මිලදීගෙන තිබුණ ද එම ජල ටැංකි තෝරාගත් ප්‍රතිලාභීන් වෙත ලබානොදී ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් විසින් ප්‍රදේශයේ මරණාධාර සමිති හා වෙනත් පුද්ගලයන්ට ලබාදී තිබුණි. | ප්‍රතිලාභ වෙන්කර ඇති අරමුණට අනුගත විය යුතු වේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මිරිදිය ධීවර අංශය මඟින් 2015 සිට 2019 දක්වා වූ වර්ෂවල එකතුව රු.16,602,950 ක් වටිනා මත්ස්‍ය ඇඟිල්ලන් 10,038,565 ක් මධ්‍යම පළාත තුළ පැවති ජලාශ 12 සිට 35 දක්වා වූ ප්‍රමාණයකට මුදාහැර තිබුණි. මෙම මත්ස්‍ය ඇඟිල්ලන් තාක්ෂණික ක්‍රමවේදයකින් බැහැරව ප්‍රවාහනය කර තිබූ බැවින් සියයට 35 සිට 50 දක්වා ප්‍රමාණයකින් මිය යන බව ධීවර සමිති මඟින් ලබා ගත් තොරතුරු අනුව අනාවරණය විය. | මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රවාහනයේ දී නියමිත තාක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීමට කටයුතු කිරීම. | බහුතරයක් ධීවර සමිති සක්‍රීය ධීවර සමිති නොවේ. රේඛීය අමාත්‍යාංශ විසින් ද මත්ස්‍යයින් ජලාශවලට මුදාහැරීම සිදු වේ. |
| (ඇ) | මිරිදිය ධීවර සමාජ සුභසාධක වැඩසටහන යටතේ 2015 සිට 2019 දක්වා කාලය තුළ එකතු වටිනාකම රු.4,306,077 ක් වූ ධිවර ආම්පන්න ධීවර සමිතිවලට ලබාදී තිබුණ ද අවශ්‍යතා හඳුනාගෙන ධීවර කටයුතුවලට යෝග්‍ය ධීවර ආම්පන්න මිලදීගෙන ලබාදීමක් සිදුවී නොතිබූ අතර, ධීවර සමිති වෙත බෙදා දුන් උපකරණ එකී සමිතිවල විධිමත්ව ලේඛන ගතවීමක් ද සිදුකර නොතිබුණි. | අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රතිලාභ ලබාදීම හා ප්‍රතිලාභ විධිමත්ව අදාළ ආයතන තුළ ලේඛනගත කිරීමට කටයුතු කිරීම. | ලබාදී ඇති ප්‍රතිලාභවලට අමතරව වෙනත් තාක්ෂණික උපකරණ පිළිබඳ ධිවර සමිති මඟින් ඉල්ලීම් ඉදිරිපත් වී නොමැත. ඉදිරියේදී විධිමත්ව ලේඛන ගත කිරීමට අදාළ සමිති වෙත උපදෙස් ලබාදී ඇත. |

### 5.8.3 අපේක්ෂිත නිමවුම් ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 සිට 2019 දක්වා වූ වර්ෂවල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ එකතුව රු.11,744,000 ක් වූ ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කර තිබූ බිත්තර වී වැඩසටහනට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ පර්යේෂණ අංශය විසින් නිකුත් කර තිබූ බීජ පරීක්ෂණ වාර්තා අනුව මහනුවර දිස්ත්‍රික්කයේ 2017 සිට 2019 දක්වා | අදාළ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් අධීක්ෂණය හා පසු විපරම් කටයුතු සිදු කිරීම. | නියමිත පරිදි වර්ෂාව නොලැබෙන බැවින් වගාවන් ප්‍රමාද වී ආරම්භ කිරීම මත අස්වනු නෙලන අවස්ථාවේදී ද වර්ෂාවට හසුවේ. මේ හේතුවෙන් සියයට 13 |

| | | | |
|---|---|---|---|
| | කාලය තුළ ලියාපදිංචි ගොවිපල මඟින් ලබාදී ඇති සහතික කළ බිත්තර වී බුසල් 560 ක පරීක්ෂණ සාම්පල් වාර 182 කින් සාම්පල් 84 ක් අසමත්වී තිබුණි. එමෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ 2017 සිට 2019 දක්වා වූ වර්ෂවලදී සහතික කරන ලද බීත්තර වී බුසල් 18,364 කින් රු.මි 3.9 කට ආසන්න වටිනාකමකින් යුත් බුසල් 2,542 ක ප්‍රමාණයක ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂණ අසමත් වී තිබුණි. මේ අනුව ලියාපදිංචි ගොවිපල මඟින් ලබාගන්නා සහතික කළ බිත්තර වී අසමත්වීමේ ප්‍රමාණය වැඩි වුවද ඒ පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගේ මැදිහත් වීමක් නොතිබුණි. | | කට අඩු මට්ටමේ තෙතමනය පවත්වා ගැනීමට නොහැකි වී ඇත. පවත්නා කාලගුණික තත්ත්වය නිෂ්පාදනයේ ගුණත්වයට බලපා ඇත. විශේෂයෙන් මෙම බීජවල තෙතමනය හේතුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ අංශය විසින් ප්‍රමිතිය පිළිබඳ ප්‍රතිඵල අසමත් වුවද එම බීජ ගොවීන් විසින් අලෙවි කර ඇත. |
| (ආ) | ලොකු ලූණු බීජ ජාතික අවශ්‍යතාවයෙන් සියයට 40 කට වැඩි නිෂ්පාදනයක් වන කිලෝග්‍රෑම් 15000 – 20000 දක්වා ප්‍රමාණයක් මාතලේ දිස්ත්‍රික්කයේ ගොවීන් මඟින් සිදුවන අතර පළාත් කෘෂිකර්ම දෙපාර්මේන්තුව විසින් 2015 - 2018 දක්වා වර්ෂවල ලොකු ලූණු බීජ නිෂ්පාදනය වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.26,475,000 ක් වැයකර තිබුණි. ඒසේ වුවද බීජ නිෂ්පාදනය අඛණ්ඩව කිලෝග්‍රෑම් 17500 සිට 4407 දක්වා සීඝ්‍ර පහත වැටීමක් පැවැතුණි. ඒ අනුව උග්‍ර ලෙස නිෂ්පාදනය සීමා වූ ලොකු ලූණු නිෂ්පාදනය වෙනුවෙන්, 2019 වර්ෂයේදී කිසිදු වැඩසටහනක් මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගොවීන්ගේ ගැටළු හා අවදානම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකර ජාතික නිෂ්පාදනයට වන දායකත්වය වැඩිකර ගැනීමට හැකි ලෙස කටයුතු කිරීම හා පසු විපරම් කිරීම. | 2018 වර්ෂයේ නිෂ්පාදනය කරන ලද බීජ අලෙවි කිරීමේ ගැටළුවක් ඇතිවීම හේතුවෙන් 2019 වර්ෂයේ ගොවීන් බීජ නිෂ්පාදනයට නැඹුරු කිරීම අපහසු විය. 2020 වසරේ සිට මෙම වගාව යථා තත්ත්වයට පත්කර ගැනීමේ ප්‍රචාරණාත්මක හා ව්‍යාප්ති වැඩසටහන් ආරම්භ කරමින් දැනටමත් ක්‍රියාත්මක කරමින් සිටී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මධ්‍යම පළාත් යෞවන කටයුතු, වනිතා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, සමූපකාර සංවර්ධන හා කර්මාන්ත අමාත්‍යාංශය විසින් ස්වයං රැකියා උත්පාදනය කිරීමේ අරමුණින් 2016 සිට 2019 වර්ෂය දක්වා රු.45,581,286 ක ජූකී, ඕවර්ලොක්, සිග්සැග් සහ සාමාන්‍ය මහන මැෂින් 1708 ක් අඩු ආදායම්ලාභී කාන්තාවන්ට බෙදා දී තිබුණු නමුත් මැෂින් බෙදාදීමේ අරමුණ ඉටු නොවූ අවස්ථා සැලකිය යුතු මට්ටක පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත හැකි ව්‍යාපෘති වෙනුවෙන් වියදම් දැරීම. | මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයද සමඟ ලැබුණු අමාත්‍යාංශයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත්ව නැති අතර, 2019 වර්ෂයේදී පසු විපරම් සිදුකර ඇත. |

**5.8.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක් තිස්සේ සන්තකයේ දරන ගලේවෙල නගර මධ්‍යයේ පිහිටා ඇති වෛද්‍ය නිල නිවස පිහිටි ඉඩම මෙතෙක් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කිරීම. | අඩුපාඩුව පිළිගනිමි. |
| (ආ) | මාතලේ කලාප කාර්යාලයට අයත් පාසල් 61 ක ඉඩම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර එම ඉඩම් මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාසල් ඉඩම් පවරා ගැනීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, පශු වෛද්‍ය කාර්යාල 24 ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල 02 ක්, පේරාදෙණිය සහ නුවරඑළිය පශු රෝහල සහ දෙපාර්තමේන්තුවට අයත් රජයේ නිවාස | දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඉඩම් පවරාගැනීම තුළින් වත්කම්වල සුරක්ෂිත බව | අදාළ ඉඩම් පවරා ගැනීම සඳහා ඉදිරි කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. තවද මහනුවර, මාතලේ හා |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යන ඉඩම් කැබලි 22 ක අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | තහවුරු කිරීම. | නුවරඑළිය මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගොස් මේ සම්බන්ධව සාකච්ඡා කර ඇත. |
| (ඈ) | කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය හා මාතලේ හෝටල් පාසල පිහිටි ගොඩනැගිලි විධිමත්ව පවරා ගැනීමක් සිදු නොකර අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් 2018 හා 2019 වර්ෂවල පිළිවෙළින් රු.1,667,500 ක් හා රු.8,283,119 ක් වැයකර තිබුණි. | අදාළ ගොඩනැගිල්ල විධිමත්ව පවරා ගැනීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන හෙක්ටයාර් 7.4327 ක භූමි ප්‍රමාණයක් සහිත ඉඩම් 04 ක් ද ඇතුළුව ඉඩම් 05 ක් විධිමත් ලෙස පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කිරීම. | එකඟ වෙමි. මෙම ඉඩම් පවරා ගැනීම සඳහා මූලික කටයුතු මේ වන විට ඉටුකර ඇත. |

**5.9 වත්කම් කළමනාකරණය**

**5.9.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයෙහි රු.74,795,000 ක් වූ ප්‍රවාහන උපකරණ සහ රු.35,000 ක් වූ යතුරුපැදිවල වටිනාකම සටහන් කර නොතිබුණු අතර රු.11,730,000 ක නිල නිවාස හා රු.325,908,000 ක කාර්යාල ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළ වර්ෂය, තක්සේරු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙහි දක්වා යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් සියලුම ජංගම නොවන වත්කම් ලේඛනගත කර යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කිරීම. | තක්සේරු වටිනාකම ඇතුළත්කර ලේඛනය නියමිත ආකෘතිය පරිදි යාවත්කාලීන කරමින් පවතී. |

## 5.9.2 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා ලේකම් කාර්යාලයට අයත් රු.5,000,000 වටිනා මෝටර් රථයක් සහ වටිනාකම සඳහන් නොවූ ජීප් රථයක්ද, කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වටිනාකම සඳහන් නොවන වාහන 02 ක් ද ඇතුළුව වාහන 04 ක් මාස 04 සිට වර්ෂ 4 ක් දක්වා නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කිරීම. | සභා ලේකම් කාර්යාලයේ රථය ප්‍රධාන ලේකම් කාර්යාලයට නැවත භාරගන්නා ලෙසද ඉල්ලීම් කර ඇත. ප්‍රමාණවත් වාහන පැවතීම සහ දුෂ්කර මාර්ගවල KG-1322 දරන වාහනය ධාවනය ආර්ථික වශයෙන් අවාසිදායක වීම. 32-3910 දරන වාහනය ඉතා පැරණි වාහනයක් නිසා අළුත්වැඩියා කර ඉදිරියේදී ප්‍රයෝජනට ගනිමි. |
| (ආ) | සංචාරක හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලක් සහ රජයේ නිවාස 07 ක් වර්ෂ 02 සිට 12 දක්වා කාලයක් හා 2003 වසරේ ඉදිකිරීම ආරම්භ කර රු.8,916,173 ක වියදමක් දරා වැඩ නිම කර තිබූ හඟුරන්කෙත, ගෝනගන්තැන්න ප්‍රාදේශීය රෝහලේ මාතෘ හා ළමා සායන ගොඩනැගිල්ල වසර 15 ක කාලයක් සිට නිශ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්ය සම්පත් ඵලදායී කාර්යයකට යොදා ගැනීමට කටයුතු කිරීම. | සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල 2017 ජූනි මස පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට නියමිතව තිබුණු බැවින් වියදම් දරා නඩත්තු කිරීම ඵලදායී නොවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට හා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වසර 10 කට අධික කාලයක සිට භාවිතයට නොගන්නා අත් ට්‍රැක්ටර් 2, ට්‍රැක්ටර් රථයක්, ත්‍රීරෝද රථයක් හා යතුරුපැදි 12 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට නොගන්නා වත්කම් චක්‍රලේඛ අනුව අපහරණ කිරීමට කටයුතු කිරීම. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් වාහන දැනට භාවිතයේ නොමැති බැවින් වෙන්දේසි කිරීමට හෝ ඉවත් කිරීමට පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ දැනුවත් කර ඇත. සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ යතුරුපැදි සම්බන්ධයෙන් වෙන්දේසි කටයුතු ප්‍රධාන ලේකම් කාර්යාල මඟින් සිදුවන බැවින් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත. |
| (ඈ) | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ දී රු.460,000 ක පිරිවැයක් දරා ආරම්භ කරන ලද කාර්යාලීය අවශ්‍යතා සඳහා සැකසුණු පරිගණක මෘදුකාංගය හා එය කාර්යක්ෂමව යෙදවීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.1,347,500 ක පිරිවැයකින් යුතුව මිලදීගත් ටැබ් යන්ත්‍ර 55 ක් ඵලදායී අයුරින් අරමුණුගත කාර්යයට යොදවා නොතිබුණි. | නිෂ්කාර්ය සම්පත් ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කිරීම. | නිවාඩු අයදුම් කිරීම, ප්‍රගති වාර්තා ලබාගැනීම ගමන් වියදම් ඉල්ලීම, වැඩසටහන් විස්තර පරික්ෂා කිරීම අරමුණ වේ. ඉදිරියේදී මෘදුකාංගය හරහා ඉදිරිපත් නොවන වවුචර් අනුමත කිරීමෙන් වැළකී සිටින බව දන්වමි. |

### 5.9.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහනුවර හා මාතලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවලට අයත් වාහන 11 කට යොදවා ඇති ඉන්ධන දෛනික ධාවන සටහන් අනුව හා විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අතර ලීටර් 3449 ක වෙනසක් තිබූ අතර එහි වටිනාකම රු.358,698 ක් විය. | ඉන්ධන වියදම් දෛනික ධාවන සටහන් විස්තරවලට සමාන විය යුතු වේ. | වැය කරන ලද ඉන්ධන වියදම් ලේඛනගත වීම මගහැරී ඇත. 42-0634 දරන ලොරිය වෙනුවෙන් ඉන්ධන වියදම් වෙන්කර නොමැත. වෙනත් ආයතනවලින් ඉන්ධන වියදම් දැරීම මෙම වෙනස් වීම්වලට හේතු වී ඇත. |

### 5.10 කාර්යමණ්ඩල පරිපාලනය

2019 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

#### 5.10.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන හා ප්‍රඥප්ති මඟින් පිහිටවූ ආයතනවල සේවක සංඛ්‍යාව (පාසල් හා සෞඛ්‍ය කාර්යමණ්ඩල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,019 | 755 | 292 | 29 |
| තෘතියික මට්ටම | 483 | 389 | 94 | 1 |
| ද්විතියික මට්ටම | 7,122 | 5,349 | 1,922 | 160 |
| ප්‍රාථමික මට්ටම | 7,380 | 5,986 | 1,357 | 408 |
| කොන්ත්‍රාත් පදනම මත | 38 | 75 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| අනියම් පදනම මත | - | 408 | - | - |
| ආදේශක පදනම මත | - | 19 | - | - |
| වෙනත් (ස්ථිර දීමනා) | 13 | | 12 | |
| ගුරු සහායක | - | 1,123 | - | 1,123 |
| පුද්ගලික කාර්ය මණ්ඩලය (ඇමතිවරුන්) | 89 | 15 | 74 | - |
| වෙනත් (මගී ප්‍රවාහන සේවා අධිකාරිය) | 329 | 263 | 61 | - |
| | --------- | -------- | --------- | --------- |
| එකතුව | 16,473 | 14,382 | 3,812 | 1,721 |
| | ===== | ===== | ===== | ===== |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සමස්ථ කාර්යමණ්ඩලයේ තනතුරු 6 ක පුරප්පාඩු 132 ක් පැවතුණි. කාර්යමණ්ඩලය ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් කාර්යාලවලට වශයෙන් වෙන් වෙන්ව අනුමත කරගෙන නොමැති වීම හේතුවෙන් එක් එක් දිස්ත්‍රික් කාර්යාලයේ පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යා පිළිබඳ නිරීක්ෂණය කළ නොහැකි විය. | පුරප්පාඩු නිසි පරිදි හඳුනාගෙන සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. | කාර්යාල මට්ටමින් නිලධාරින් වෙන් කිරීමට කටයුතු කරන අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂමට පුරප්පාඩු දන්වා ඇත. |
| (ආ) | මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සඳහා අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 76 න් 44 ක් බඳවාගෙන තිබූ අතර ඉන් නිලධාරින් 24 දෙනකු අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 03 කට අනුයුක්ත කර අමාත්‍යාංශයේ වියදමින් වැටුප් ගෙවමින් පැවතුණි. මෙම අනුයුක්ත කිරීම් හේතුවෙන් එම දෙපාර්තමේන්තු තුනෙහි සංවර්ධන නිලධාරින් 18 කගේ අතිරික්තයක් පැවතුණි. | අනුමත තනතුරු ඉක්මවා අනුයුක්ත කිරීම නොකළ යුතු වේ. | අමාත්‍යාංශයේ අනුමත සංවර්ධන නිලධාරි තනතුරු සංඛ්‍යාව 76 ක් වුවද අමාත්‍යාංශය වෙත යොමුකර ඇති සංවර්ධන නිලධාරින් සංඛ්‍යාව 44 ක් වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාජ සහතිකපත් ඉදිරිපත් කර තිබූ අනියම් සෞඛ්‍ය කාර්ය සහායකයින් 07 දෙනෙකු බඳවාගෙන 2017 ජනවාරි සිට 2019 ජූනි දක්වා වැටුප් ලෙස රු.2,457,000 ක් ගෙවා තිබුණි. | ව්‍යාජ අධ්‍යාපන සහතික ඉදිරිපත් කළ සේවකයන් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීම. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | ප්‍රධාන ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්, තෘතියික මට්ටමේ තනතුරු 07 ක්, ද්විතීයක මට්ටමේ තනතුරු 133 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් වශයෙන් තනතුරු 167 ක පුරප්පාඩු පැවති අතර ද්විතියික මට්ටමේ සේවකයින් 03 කගේ අතිරික්තයක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. | දීප ව්‍යාප්ත සේවය හා සංවර්ධන නිලධාරි පුරප්පාඩු පිරවීමට අදාළ අමාත්‍යාංශවලින් ඉල්ලීම් කර ඇත. කළමණාකරන සේවා නිලධාරින් බඳවා ගැනීමට තරඟ විභාග පවත්වා ඇති අතර වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලද පසු බඳවා ගැනීම් සිදුකරන බව. |

## 5.10.2 පාසල් කාර්යමණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,458 | 990 | 471 | 3 |
| නියෝජ්‍ය විදුහල්පතිවරු /සහකාර විදුහල්පති | 575 | 628 | 95 | 148 |
| ගුරුභවතුන් | 27,714 | 28,350 | 434 | 1,070 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 2,222 | 1,473 | 1,070 | 321 |
| එකතුව | 31,969 | 31,441 | 2,070 | 1,542 |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට ගුරුභවතුන් 04 දෙනෙකු අනුයුක්ත කර තිබුණු අතර, නිලධාරීන් 07 දෙනෙකු මාස 04 සිට අවු.10 දක්වා කාලයක් තිස්සේ දෙපාර්තමේන්තුව යටතේ වැටුප් ගෙවමින් වෙනත් කාර්යාල වෙත අනුයුක්ත කර තිබුණි. ශිල්පීය නොවන සේවයේ 09 දෙනෙකු හා අනෙකුත් සේවාවන්ට අයත් නිලධාරීන් 4 දෙනෙක් වෙනත් කාර්යාලවලින් වැටුප් ගෙවමින් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ගෙන තිබීම නිසා ශිල්පීය නොවන සේවයේ 07 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත කාර්යමණ්ඩල සංශෝධනය කර ගැනීම. | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය නොවීමෙන් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා ඉටුකර ගැනීමට සිදුවීම, සේවා අවශ්‍යතා හා පෞද්ගලික අවශ්‍යතා මත වෙනත් කාර්යාලවලට අනුයුක්ත කිරීම හා සේවකයින් ප්‍රමාණවත් නොවීම හේතු වී ඇත. |
| (ආ) | ගලේවෙල කලාපයට අයත් පාසල් 47 ක, නාඋල කලාපයට අයත් පාසල් 15 ක, මාතලේ කලාපයට අයත් පාසල් 36 ක හා විල්ගමුව කලාපයට අයත් පාසල් 26 ක විදුහල්පති පුරප්පාඩු සඳහා විධිමත් ක්‍රමවේදයකින් තොරව ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන් පත්කර තිබුණි. | රාජකාරි පැවරීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීම. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | ගලේවෙල කලාපයේ ගුරුඋපදේශක තනතුරු 09 ක් සඳහා ගුරුභවතුන් 09 දෙනෙකු පූර්ණ කාලීනව කලාප කාර්යාලයට අනුයුක්ත කිරීම නිසා එම ගුරුභවතුන්ගේ සේවය පාසලට අහිමි වී තිබූ අතර එම පාසල්වල පුරප්පාඩු පිරවීමට ද නොහැකි වී තිබුණි. | ගුරු උපදේශක තනතුරු සඳහා අනුයුක්ත කළ ගුරුභවතුන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාතලේ කලාපයේ පාසැල්වල සිංහල මාධ්‍යයේ ගුරුභවතුන් 47 කගේ හා දෙමළ මාධ්‍ය ගුරුභවතුන් 54 කගේ පුරප්පාඩු පැවතුණි. | ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

## 5.10.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

-------------------------

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,308 | 1,000 | 308 | - |
| තෘතියික මට්ටම | 229 | 173 | 56 | - |
| ද්විතියික මට්ටම | 4,234 | 3,334 | 914 | 14 |
| ප්‍රාථමික මට්ටම | 3,610 | 2,408 | 1,182 | - |
| අනියම් | - | 20 | - | - |
| එකතුව | 9,381 | 6,935 | 2,460 | 14 |

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

## 6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂ 05 ක මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | සභාගත කළ දිනය |
|---|---|---|
| 2014 | 2015.10.08 | 2015.11.03 |
| 2015 | 2016.11.16 | 2017.07.18 |
| 2016 | 2017.11.27 | 2018.06.19 |
| 2017 | 2018.10.31 | - |
| 2018 | 2019.05.31 | - |

## 6.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාළව පළාත් මූල්‍ය රීති 54.6 පරීක්ෂණ මගින් කපාහැරීමට, ගැලපුම් කිරීමට හා ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ පිළිවෙලින් රු.5,747,195 ක් රු.3,389,528 ක් හා රු.3,954,598 ක් වූ ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු අවසන් කර නොතිබුණි. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීම. | ඒ පිළිබඳ කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | මහනුවර ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ 2001 වර්ෂයේ ගබඩා සමීක්ෂණයේදී අනාවරණය වූ රු.1,217,482 ක ගබඩා ද්‍රව්‍ය ඌනතාවය සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 54.6 යටතේ පරීක්ෂණයක් පවත්වා ගබඩා භාරකරු 2002 අප්‍රේල් 18 දින සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 වගන්තිය යටතේ විශ්‍රාම ගන්වා වසර 15 ක් පමණ ගතවී ඇති නමුත් අදාළ ගබඩා ඌනතාවය රජයේ ගාස්තු ද සමඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගබඩා භාණ්ඩ ඌණතාවයට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය කටයුතු කිරීම. | ඡේදය පිළිගනිමි. |
| (ඇ) | 2007 සිට 2014 දක්වා වූ වර්ෂවලට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබූ ආයතන 09 ක විගණන ඡේද 105 ක් සම්බන්ධයෙන් පළාත් ගිණුම්කාරක සභාව විසින් කළ නියෝග ක්‍රියාත්මක කිරීම මන්දගාමී තත්ත්වයක පැවතුණි. | නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. | අදහස් දක්වා නොමැත. |

## 6.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මධ්‍යම පළාත් සභාවේ සැලසුම් දෙපාර්තමේන්තුව යටතේ සැලසුම් ක්ෂේත්‍රයට අදාළ දැණුම ලත් නිලධාරින් 09 දෙනෙකු ඇතුළු 37 ක කාර්ය මණ්ඩලයක් සිටියදී මධ්‍යම පළාත් තිරසාර සංවර්ධනය සඳහා වූ පස් අවුරුදු සැලැස්ම සකස් කිරීමට එම ක්ෂේත්‍රය පිළිබඳ කිසිදු සම්බන්ධයක් නොමැති කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය සමඟ රු.4,695,000 ක ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා සෘජුවම වගකීම් දරන නිලධාරින් 07 දෙනෙකුට දීමනා ලෙස රු.1,753,861 ක් ද ගෙවා තිබුණි. එහෙත් මෙම කටයුතු අවසන්ව නොතිබීම නිසා 2020 වර්ෂය වෙනුවෙන් මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ද නොහැකි වී තිබුණි. | ආයතනය සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම. | මෙම සැලසුම සැකසීමට දායකත්වය සැපයූ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන වැඩසටහනේ ඉල්ලීම පරිදි බාහිර පාර්ශවයක් වෙතින් සැලසුම සකස් කර ගෙන ඇත. මෙවැනි කාර්යයක් ඉටුකරවා ගත හැකි එකම ආයතනය වන කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය මඟින් මෙය ඉටුකරවා ගෙන ඇත. |